සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2021-10-30
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** මූල්‍ය ගිණුම්කරණයේ අරමුණක් වන්නේ:

(1) ව්‍යාපාරයේ සේවකයන් අභිප්‍රේරණය කිරීමයි.

(2) ව්‍යාපාරයේ ලාභදායකත්වය වැඩි කිරීමයි.

(3) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය තේරුම් ගැනීමයි.

(4) ව්‍යාපාරයේ නිෂ්පාදිතවල විකුණුම් මිල තීරණය කිරීමයි.

**1.2** 2021 මාර්තු 31 දිනට, **සමතල ට්‍රේඩර්ස්හි** 2021 මාර්තු මාසය සඳහා විදුලි වියදම් වශයෙන් රු.25,000/- ක් වාර්තා කර තිබේ. නමුත් එහි ගෙවීම කර ඇත්තේ 2021 අප්‍රේල් මාසයෙහිදීය.

ඉහත සඳහන් ප්‍රකාශයට අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අස්තිත්ව සංකල්පයයි. (2) උපචිත සංකල්පයයි.

(3) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි. (4) ආරක්ෂණ සංකල්පයයි.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී කාල වෙනසක් (time difference) සඳහා උදාහරණයක් ලෙස සළකනු ලබන්නේ කුමක් ද?

(1) සෘජු තැන්පතුවක් වශයෙන් **සරත්ගෙන්** ලැබුණු රු.25,000/-, ගිණුම් පොත්වල වාර්තාකර නොමැත.

(2) රු.5,000/- ක චෙක්පොත් ගාස්තුව, ගිණුම් පොත්වල වාර්තාකර නොමැත.

(3) සැපයුම්කරුවෙකුට නිකුත් කළ රු.23,000/- ක චෙක්පතක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත.

(4) රු.3,500/- ක මුදලක්, බැංකුව විසින් වැරදීමකින් හර කර තිබීම.

**1.4** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කේවලස්වාමි ව්‍යාපාරයක් වන **නයනාගේ ව්‍යාපාරයේ** ගිණුම් පොත්වලින් පහත සඳහන් ගනුදෙනු, උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---:|
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | 1,800,000 |
| වර්ෂය තුළදී සිදුකළ ගැනිලි | 175,000 |
| වර්ෂය තුළදී අයිතිකරු විසින් ව්‍යාපාරයට මාරු කළ පෞද්ගලික මෝටර් රථය | 1, 000,000 |
| 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 490,000 |

ඉහත සඳහන් තොරතුරු පදනම්ව, 2021 මාර්තු 31 දිනට ස්කන්ධය (ප්‍රාග්ධනය) වන්නේ:

(1) රු.3,465,000/-. (2) රු.3,115,000/-. (3) රු.2,465,000/-. (4) රු.2,115,000/-.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, වත්කම් අඩුවීමට බලපාන ගනුදෙනුව තෝරන්න:

(1) භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථයක් රු.1,500,000/- කට ණයට මිලදී ගැනීම.

(2) වාණිජ බැංකුවකින් රු.1,000,000/- ක ණය මුදලක් ලබා ගැනීම.

(3) නැවත විකිණීම සඳහා රු.350,000/- ක තොගයක් ණයට මිලදී ගැනීම.

(4) ණයහිමියෙකුට රු.250,000/- ක මුදලක් ගෙවීම.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ නිමැවුමක් (output) වන්නේ කුමක් ද?

(1) ආදායම් ප්‍රකාශය. (2) දෛනික විකුණුම් පොත.

(3) ජර්නල් වවුචරය. (4) විකුණුම් ඉන්වොයිසිය.

**1.7** ණයට මිලදීගත් භාණ්ඩ, ආපසු හරවා එවීමේදී ගැනුම්කරුවෙකු විසින් භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ:

(1) බැරපතයි. (2) ගැනුම් ඉන්වොයිසියයි. (3) ගැනුම් ඇණවුමයි. (4) හරපතයි.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, විශේෂිත ගිණුම්කරණ මෘදුකාංගයක් [Specialized (Customized) Accounting Software] සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ඇක්පැක් (ACCPAC). (2) තොග පාලන පද්ධතිය (Stock Control System).

(3) ක්වික් බුක් (Quick Book). (4) සේජ් (SAGE).

**1.9** මහනුවර ඇති ඉඩමක් **රාමා ට්‍රේඩර්ස්** සතුවන අතර, එය, **රාමා ට්‍රේඩර්ස්හි** 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එහි ගැනුම් මිල වන රු.5,000,000/- ට පෙන්වා තිබේ. නමුත් 2021 මාර්තු 31 දිනට මෙම ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම රු.6,000,000/- ක් විය. මේ සම්බන්ධයෙන් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) සංගතතා සංකල්පයයි. (2) ගැලපුම් සංකල්පයයි.

(3) ඓතිහාසික පිරිවැය සංකල්පයයි. (4) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

**1.10** **සම්පත් ට්‍රේඩර්ස්,** 2021 ජනවාරි 01 දින රු.500,000/- කට ලොරි රථයක් විකුණා තිබේ. මෙම රථය 2017 ජනවාරි 01 දින රු.1,600,000/- ක පිරිවැයකට මිලදී ගන්නා ලදී. අස්තිත්වයේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් වර්ෂයකට 20% බැගින් මෝටර් වාහන ක්ෂය කිරීමයි.

ඉහත සඳහන් තොරතුරුවලට අනුව, ලොරි රථය විකිණීමෙන් ලද ලාභය වූයේ:

(1) රු.500,000/-. (2) රු.180,000/-. (3) රු.1,600,000/-. (4) රු.900.000/-.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** අස්තිත්ව සංකල්පයට අනුව, ව්‍යාපාරය සහ අයිතිකරු එකිනෙකට වෙන්වූ ස්වාධීන අස්තිත්ව දෙකක් ලෙස සලකනු ලැබේ.

**1.12** එක් එක් මාසය අවසානයේදී ව්‍යාපාර අස්තිත්වයක මුදල් පාලන ගිණුමේ දැක්වෙන ශේෂය, එක් එක් මාසය අවසානයේ එහි බැංකු ප්‍රකාශනයේ පෙන්වනු ලබන ශේෂයට සමාන විය යුතුය.

**1.13** පොදු ජර්නලය යනු මූලික සටහන් පොතකි.

**1.14** වියදම් සහ ආදායම් යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට සෘජුවම සම්බන්ධ මූලිකාංග වේ.

**1.15** අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින අස්තිත්වයක වර්තමාන බැඳීමක් වගකීමක් ලෙස හැඳින්වේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයන් (stakeholders) දෙදෙනෙකු (02) සඳහන් කරන්න.

**1.17** පරිගණකගත ගිණුම්කරණ පද්ධති වෙත යොමුවීමට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.18** ජංගම වගකීම් සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** **ජැක්සන් ට්‍රේඩර්ස්හි** 2021 මාර්තු 31 දිනට මුදල් පාලන ගිණුමේ හර ශේෂය රු.435,000/- ක් වූ අතර, පහත සඳහන් හේතු නිසා බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එම ශේෂය එකඟ නොවීය:

- රු.25,000/- ක සෘජු තැන්පතුවක්, මුදල් පාලන ගිණුමේ වාර්තා වී නොමැත.
- 2021 මාර්තු 30 දින නිකුත් කළ රු.75,000/- ක චෙක්පතක්, ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත.
- රු.5,000/- ක බැංකු ගාස්තුව, මුදල් පාලන ගිණුමේ වාර්තා කර නොමැත.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්, 2021 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ පෙන්වනු ලබන ශේෂය හඳුනා දක්වන්න.

**1.20** **XYZ ට්‍රේඩර්ස්** හි පොත්වලින් 2021 ජනවාරි මාසය සඳහා පහත තොරතුරු උපුටා ගන්නා ලදි:

| | රු. |
|---|---|
| 2021 ජනවාරි 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැති) පාලන ගිණුමේ ශේෂය | 500,000 |
| මාසය සඳහා දෛනික විකුණුම් පොතේ එකතුව | 400,000 |
| මාසය සඳහා ආපසු එවුම් ජර්නලයේ එකතුව | 25,000 |
| මාසය තුළදී ණයගැතියන්ගෙන් ලැබුණු මුදල් | 200,000 |

2021 ජනවාරි 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැති) පාලන ගිණුමේ ශේෂය හඳුනා දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

(A) **සැම්,** 2021 මාර්තු 01 දින සිල්ලර වෙළෙඳසැලක් ආරම්භ කරන ලදි. 2021 මාර්තු මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2021.03.01 | මූලික ප්‍රාග්ධනය ලෙස මුදලින් රු.1,000,000/- ක් ආයෝජනය කරන ලදි. |
| 2021.03.02 | නැවත විකිණීම සඳහා රු.800,000/- ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදි. |
| 2021.03.05 | රු.50,000/- ක් වූ මාසික කඩ කුලිය ගෙවන ලදි. |
| 2021.03.10 | පිරිවැය රු.500,000/- ක් වූ භාණ්ඩ, රු.750,000/- කට අත්පිට මුදලට විකුණන ලදි. |
| 2021.03.15 | රු.150,000/- ක සේවක වැටුප් ගෙවීය. |
| 2021.03.31 | රු.500,000/- ක බැංකු ණයක් ලබා ගන්නා ලදි. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සඳහන් කරන්න**.

(තොගය + වෙළෙඳ ණයගැතියෝ + මුදල් = ස්කන්ධය + වගකීම්) (ලකුණු 06)

(B) **සංඛ ට්‍රේඩර්ස්,** කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත සඳහන් ණයට මිලදී ගැනීමේ ගනුදෙනු 2021 මාර්තු මාසය සඳහා උපුටා ගන්නා ලදි:

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරුගේ නම | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වෙළෙඳ වට්ටම |
|---|---|---|---|---|---|---|
| මාර්තු 01 | 465 | නිමල් සහ සමාගම | සහල් මලු | 50 | 500 | - |
| මාර්තු 10 | 950 | සමන්ත ග්‍රොසරි | සීනි මලු | 100 | 2,000 | - |
| මාර්තු 15 | 495 | නිමල් සහ සමාගම | සහල් මලු | 100 | 500 | 5% |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු මාසය සඳහා **සංඛ ට්‍රේඩර්ස්** හි දෛනික ගැනුම් පොත (ගැනුම් ජර්නලය) **පිළියෙල කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**KDI ට්‍රේඩර්ස්,** රබර් නිෂ්පාදිත නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **KDI ට්‍රේඩර්ස්හි** පොත්වලින් උපුටාගන්නා ලදි:

| **විස්තරය** | **රු.** |
|---|---:|
| 2020 අප්‍රේල් 01 දිනට, අමුද්‍රව්‍ය තොගය | 600,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 2,300,000 |
| 2020 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ | 350,000 |
| සෘජු වේතන | 890,000 |
| විදුලිය | 360,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 625,000 |
| ජලය | 180,000 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ මත ක්ෂය වීම් | 110,000 |
| ගොඩනැගිල්ල මත ක්ෂයවීම් | 135,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනට අවසාන තොග ශේෂයන් පහත පරිදි අගය කරන ලදි:

| **විස්තරය** | **පිරිවැය (රු.)** |
|---|---:|
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 290,000 |
| අමුද්‍රව්‍ය තොගය | 1,250,000 |

(2) ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙන් 90% ක් කම්හලට අයත් වන අතර, පිරියත සහ යන්ත්‍රෝපකරණ සම්පූර්ණයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කරනු ලැබේ.

(3) පහත වියදම්, පහත සඳහන් පරිදි බෙදා වෙන් කළ යුතුය:

| **වියදම්** | **කම්හල** | **කාර්යාලය** |
|---|---:|---:|
| විදුලිය | 90% | 10% |
| ජලය | 60% | 40% |

(4) සෘජු වේතනවලට අමතරව, නිෂ්පාදනය කරන සෑම ඒකකයකටම, ඒකකයකට රු.100/- බැගින් වන අමතර දිරි දීමනාවකට නිෂ්පාදන සේවකයන් හිමිකම් ලබයි. වර්ෂය තුළදී නිෂ්පාදනය කළ මුළු ඒකක ගණන 600 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **KDI ට්‍රේඩර්ස් හි** නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**රූබේරු** විසින් මුදලින් රු.2,500,000/- ක් ආයෝජනය කරමින් සහ රු.1,500,000/- කට අගය කළ ඔහුගේ පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරයට මාරු කරමින් 2020 අප්‍රේල් 01 දින කේවලස්වාමි ව්‍යාපාරයක් වන **රූබේරු ට්‍රේඩර්ස්,** ආරම්භ කරන ලදී.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පොත (මුදල් පාලන ගිණුම) පහත දැක්වේ:

| | හර (රු.) | | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 2,500,000 | වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 1,300,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,800,000 | අත්පිට ගැනුම් | 600,000 |
| අත්පිට විකුණුම් | 900,000 | විදුලිය | 69,000 |
| | | වැටුප් සහ වේතන | 93,000 |
| | | ජලය | 18,000 |
| | | ශේෂය ප/ගෙ | 3,120,000 |
| | **5,200,000** | | **5,200,000** |
| ශේෂය ඉ/ගෙ | 3,120,000 | | |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) මෝටර් රථය, වාර්ෂිකව පිරිවැය මත 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(2) 2021 මාර්තු 31 දිනට ලැබිය යුතු මුදල් සහ ගෙවිය යුතු මුදල් පහත දැක්වේ:

| ලැබිය යුතු මුදල් / ගෙවිය යුතු මුදල් | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 250,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 390,000 |
| උපචිත විදුලිය බිල්පත් | 11,000 |
| කලින් ගෙවූ ජල බිල්පත් | 2,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනට **රූබේරු ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**RT ට්‍රේඩර්ස්,** විදුලි උපකරණ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටියි. 2021 මාර්තු 31 දිනට **RT ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, රු.31,000/- ක වෙනසක් හඳුනාගන්නා ලදී. එම වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කරමින් කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

පහත සඳහන් වැරදි පසුව හඳුනාගන්නා ලදී:

(1) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා 2021 මාර්තු 01 දින මිලට ගත් රු.150,000/- ක කාර්යාල උපකරණයක්, කාර්යාල උපකරණ නඩත්තු ගිණුමේ වාර්තා කර තිබුණි. කාර්යාල උපකරණ, වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කරනු ලබයි.

(2) රු.150,000/- කුලී වියදම්, කුලී වියදම් ගිණුමට හර කර නොතිබුණි. කෙසේනමුත් මෙහි බැර සටහන නිවැරදිව අදාල ලෙජර් ගිණුමේ සටහන් කර තිබුණි.

(3) රු.190,000/- ක අත්පිට ගැනුම්, ගැනුම් ගිණුමට දෙවරක් හර කර තිබුණි. කෙසේවෙතත්, මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(4) ව්‍යාපාරයේ අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා ව්‍යාපාරයෙන් ලබා ගත් භාණ්ඩවල පිරිවැය රු.98,000/- ක් විය. මෙය රු.89,000/- ක් ලෙස ගැනිලි ගිණුමට හරකර තිබුණු අතර, අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

(5) දෛනික ගැනුම් පොතේ එකතුව, රු.50,000/- කින් වැඩිපුර සටහන් වී තිබුණි.

(6) ස්ථාවර තැන්පතුවක් මත ලැබුණු රු.2,500/- ක පොලිය, සම්පූර්ණයෙන්ම ගිණුම් පොත්වලින් මගහැරී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

(මුළු ලකුණු 20)

## **06** වන ප්‍රශ්නය

**මිල්කි ට්‍රේඩර්ස්** කේවලස්වාමි ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට **මිල්කි ට්‍රේඩර්ස්හි** ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**මිල්කි ට්‍රේඩර්ස්**

**2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.1,400,000/-) | 3,600 | |
| ලොරි රථය | 1,600 | |
| කාර්යාල උපකරණ | 2,000 | |
| 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 500 |
| ලොරි රථය | | 850 |
| කාර්යාල උපකරණ | | 1,200 |
| ගැනුම් | 73,000 | |
| විකුණුම් | | 114,000 |
| 2020 අප්‍රේල් 01 දිනට තොගය | 8,200 | |
| රක්ෂණය | 1,560 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 7,600 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 5,400 |
| විදුලි වියදම් | 9,600 | |
| දුරකතන ගාස්තු | 2,100 | |
| වැටුප් සහ වේතන | 22,500 | |
| බැංකු ගාස්තු | 1,200 | |
| ලැබුණු කුලී ආදායම | | 1,000 |
| දුන් වට්ටම් | 390 | |
| ප්‍රචාරණය | 1,800 | |
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 20,000 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 7,800 | |
| | **142,950** | **142,950** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනට අවසාන තොගය රු.10,200,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂයකට 10% බැගින් |
| ලොරි රථය | : | වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 25% බැගින් |

(3) රු.1,560,000/- ක රක්ෂණය, 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාල වේ.

(4) **මිල්කි ට්‍රේඩර්ස්** එහි ගොඩනැගිල්ලේ කොටසක්, **සීමාසහිත XY සමාගමට** මාසයකට රු.100,000/- බැගින් 2020 අප්‍රේල් 01 දින සිට කුලියට ලබා දී තිබේ. 2021 පෙබරවාරි සහ මාර්තු සඳහා වූ කුලී ආදායම, 2021 අප්‍රේල් මාසයේදී ලැබුණි.

(5) 2021 මාර්තු මාසය සඳහා පහත සඳහන් වියදම්, ගිණුම් පොත්වල උපචිත කර නොමැත:

| | | |
|---|---|---|
| විදුලි බිල්පත | : | රු.850,000/- |
| වැටුප් සහ වේතන | : | රු.1,800,000/- |

(6) කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වය හේතුවෙන්, ගනුදෙනුකරුවෙක් බුන්වත්යැයි ප්‍රකාශයට පත් කර ඇත. එමනිසා, ඔහුගෙන් ලැබිය යුතු රු.100,000/- ක ශේෂය, බොල් ණය ලෙස ලියා හැරීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |